# ලෝකයේ විවිධ රටවල ක්‍රීඩාවන්හි ඓතිහාසික විකාශනය

එම්. එම්. එස්. ඒ. මාරසිංහ

## සංක්ෂේපය

*ක්‍රීඩාව පිළිබඳ අවධානය යොමු කිරිමේදි අතීතයේ පැවති ක්‍රීඩා සහ ඒවා පැවැත්වූ අරමුණුත් වර්ථමානයේදි පවත්වන ක්‍රීඩා සහ අරමුණුත් අතර පැහැදිළි වෙනස්වීමක් දැකිය හැකිය. මෙම ලිපියෙහි මූලික අරමුණ වන්නේ අතීතයේ විවිධ ප්‍රදේශවල පැවති ක්‍රීඩා වල ස්වරූපය පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමයි. ඒ සඳහා ලෝකයේ රටවල් අතරින් දීර්ඝ ඉතිහාසයකට උරුමකම් ඇති රටවල් කිහිපයක් තෝරාගනු ලැබූ අතර එම රටවල තොරතුරු ඒකරාශි කරගැනීම සඳහා ද්විතියික දත්ත භාවිතා කරණු ලැබිණි. මෙම අධ්‍යයනයට අනුව, සමස්තයක් ලෙස අතීතයේදී පැවති ක්‍රීඩා වෙනත් අරමුණක් ඉටුකරගැනීමට ගත් උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වී ඇති බවත්, එය ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් ස්වරූපයක් ගෙන ඇති බවත් පැහැදිළිව පෙන්නුම් කරයි.*

## හැදින්වීම

වර්ථමානයේ පවතින ක්‍රීඩාවන්හි විවිධත්වයක් දැකිය නොහැකිය. විවිධත්වයක් ඇත්තේ පරිමාණයෙන් පමණි. ඒ ජාතික සහ අන්තර්ජාතික මට්ටම්ණි. නමුත් අතීතයේදි පැවති ක්‍රීඩා වර්ථමාන ස්වභාවයන්ට වඩා වෙනස්ය. අතීතයේදි පැවති ක්‍රීඩාවන් ආරක්ෂක කටයුතු සඳහා ප්‍රයෝජනයට ගැනීම, විනෝද වීම, කීර්තියක් ලබා ගැනීම වැනි කරුණු සඳහා පවත්වා ඇත. ඒ වගේම එම ක්‍රීඩාවන් යම් ප්‍රදේශයකට, එහි ඇති භෞතික ස්වරූපයන්ට, සංස්කෘතික ලක්ෂණවලට සිමා වී පවත්වා ඇත. එවැනි ක්‍රීඩා අතර විසි කිරිම්, දිවීම්, පැනීම්, පිහිනීම, සරඹ ක්‍රීඩා, සත්වයන් භාවිත තරඟ වලට ප්‍රධාන ස්ථානයක් හිමිවේ. නමුත් වර්ථමානයේදි මෙම සීමාවන් ඉක්මවා විවිධ පරමාර්ථ පදනම් කරගෙන ක්‍රීඩාවන් පවත්වනු ලබයි. මෙහිදී විශේෂ වැදගත් කම වන්නේ ජාත්‍යන්තර සාමය ඇතිකිරිමේ එක් උපක්‍රමයක් ලෙසත් ක්‍රීඩාව සැලකීමයි.

## ක්‍රීඩාව නිර්වචනය කිරිම

ක්‍රීඩාව යනු විශ්ව මාධ්‍යයකි. එය සැම රටකම එකම නිතිරීති පද්ධතියකට අනුව පවත්වාගෙන යනු ලබයි. ක්‍රීඩාව පිළිබඳ අවධානය යොමු කිරිමේදි පැහැදිළි වන්නේ ඒ පිළිබඳ නිවැරදි නිශ්චිත එක් නිර්වචනයක් නොමැති බවය. මීට හේතුව වන්නේ විවිධ ජාතින් ක්‍රීඩාව අර්ථ දක්වන්නේ විවිධාකාරයෙන් වීමය. සරල ලෙස ක්‍රීඩාව නිර්වචනය කිරිමේදි "නිශ්චිත පාලන සංවිධානයක් ඇති නීතිරිති හෝ මිනිස් හැසිරිම් රටාවේ අරමුණු සහ සීමා විග්‍රහ කෙරෙන, සිරිත් පිළිබඳ ඓතිහාසික පසුබිමක් ඇති ශාරීරික පසුතලයක් මත අවසන් ප්‍රතිඵලය නිශ්චය කෙරෙන අභියෝගය සහිත ක්‍රියා වශයෙනි". එසේම ක්‍රීඩාවන්හි නිරතවීමෙන් විවිධ ප්‍රතිලාභ ලබාගත හැකි බව අතීතයේ මෙන්ම වර්ථමානයේදිත් මුළු ලෝකයම දැන සිටියහ. එහිදී ක්‍රීඩාවේදී කායික වශයෙන් දැඩි වෙහෙස ගෙන දෙන ක්‍රීඩා පැවැත්වීම මඟින් නොදැමුණු ගති මැඩ පැවැත්වීමටත්, දැඩි චිත්තවේග පාලනය කිරිමටත්, තම කෞෂල්‍යයන් ප්‍රදර්ශනය කිරිමටත්, ඒවා තුළින් ප්‍රේක්ෂකයන් කුල්මත් කිරිමත්, ක්‍රීඩාවන් කිරිමට නොහැකි අයට ඒවා නැරඹීමෙන් ක්‍රීඩාවක් කිරීමට ඇති අඩුපාඩුව මඟහැර ගැනීමටත් යන කරුණු පිළිබඳව වැඩි අවධානයක් යොමු කර ඇත. මෙවැනි තත්ත්වයක් ගොඩනගා ගැනීම සඳහා අතීතයේදි මෙන් වර්ථමානයේදිත් විවිධ ක්‍රීඩා පවත්වා ඇත. නමුත් අතීතයේදි පැවති ක්‍රීඩා පහත සඳහන් ආකාරයට විස්තර කල හැකිය.

## විවිධ රටවල අතීතයේදි පැවති ක්‍රීඩා

වර්ථමානයේ මෙන් අතීතයේදි ක්‍රීඩාව පිළිබඳ එතරම් අවධානයක් නොතිබිණි. නමුත් එදිනෙදා ජිවිතයේ පැවති අත්‍යවශ්‍ය කාර්යයන් වල ඔවුන් ඉතා

ක්‍රියාශීලිව නිරත විය. පසු කාලයේ දී මේවා අතරින් විවිධ ක්‍රියාකාරකම් ක්‍රීඩාවන් බවට පත්විය. අතීතයේදි මිනිසා ක්‍රීඩා වශයෙන් පැවැත්වූ අංගයන් වූයේ විසි කිරීම්, දිවීම්, පැනීම්, පිහිනීම, සරඹ ක්‍රීඩා, සත්වයන් භාවිත තරඟ වශයෙනි. එහිදි විනෝදය පිණිසත්, ආරක්ෂක කටයුතු පවත්වා ගැනීමත් යන කරුණු පදනම් කරගෙන මෙම ක්‍රීඩාවන් පවත්වා ඇත. විවිධ රටවල පැවති පැරණි ක්‍රීඩාවන් පිළිබඳව අවධානය යොමු කිරීමේදි ප්‍රධාන වශයෙන් බැබිලෝනියාව, ග්‍රීසිය, රෝමය, ඊජිප්තුව, ක්‍රීටය, ඉන්දියාව, ශ්‍රී ලංකාව, ජපානය වැනි රටවල තොරතුරු මෙහි සඳහන් කර ඇත.

බැබිලෝනියාව

බැබිලොනියාව (ඉරාකය, සිරියාව) ගත් විට සෑම අවස්ථාවකම එම රට විවිධ ආක්‍රමණවලට ගොදුරු වීම නිසාම, රට සතුරන්ගෙන් ආරක්ෂා කරගත හැකි ක්‍රීඩාවන් සහ පුහුණුවීම් වල ඔවුන් යොමුවී ඇත. මල්ලව පොර, අත්මිටිවලින් පොර බැදීම, දිවීම, අශ්වයන් පිට යෑම ආදිය සිදුකර ඇත. බොහෝදුරට ආරක්ෂාව සඳහාම මෙවැනි ක්‍රීඩා පවත්වා ඇත.

**අත්මිටිවලින් පොර බැදීම (wrestlers)**



Source: http://www.Ancient Sports.htm

ග්‍රීසිය

ග්‍රීසියේ පැරණි ක්‍රීඩා පිළිබඳව අවධානය යොමු කිරීමේදි අතීතයේදි සංවිධානාත්මක මට්ටමක පැවත ඇත. බොහොදුරට ධනවත් පන්තියේ අවශ්‍යතාවන් සඳහා වැඩි දුර මෙය භාවිතා කර තිබිණ. පැරණිම ඔලිම්පික් ක්‍රීඩා උළෙල ක්‍රි.පු. 1370 සිට 9 වන සියවස පමණ තෙක් පවත්වා ඇත. එනම් අතීතයේදී පවා එය සංවිධානාත්මකව පවත්වා ඇත. පැවැත්වූ ක්‍රීඩාවන් වූයේ බොක්සින්, පංච ශිල්ප, කරත්ත රේස්, අශ්ව රේස්, අවි සහිත රේස්, චිත්‍ර තරඟ, ජිම්නාස්ටික්, මළල ක්‍රීඩා වේ. ඒ අතර මළල ක්‍රීඩාවට මුල් තැනක් ලැබිණි. අතීතයේදී, වර්ථමානයේදි මෙන් ජයග්‍රහණ සඳහා මුදල් හෝ භාණ්ඩ නොලැබිණි. ඔවුන් බලාපොරොත්තු වූයේ ගරු නම්බු, මල් මාලා, කීර්තිය ආදිය පමණි.

**ග්‍රීසියේ පැරණි මළල ක්‍රීඩා (Athletics)අවස්ථාවන් (510-500 B.C)**




Source: http://www.Ancient Sports.htm

**ඊජිප්තුව**

ඊජිප්තුව, ග්‍රීක සහ රෝම කාලයේදි සිට ඉතා දියුණු ක්‍රමානුකූල ශාරීරික වර්ධන ක්‍රමයක් ලෙස ක්‍රීඩාව පවත්වා ඇත. සරඹ ක්‍රීඩා, මළල ක්‍රීඩා, මල්ලව පොර, පොරබැදිම් ක්‍රීඩා, ඔරු පැදීම, ජල ක්‍රීඩා, දුනු හරඹ, කරත්ත රේස්, ආදි විවිධ ක්‍රීඩාවන් පැවතිණි. මේවා තුළ නූතන මට්ටමට සමාන තත්ත්වයක් දක්නට විය.

**ඊජිප්තුවේ උස පැනීමේ අවස්ථාවක් (high jump)**



Source: http://www.Ancient Sports.htm,

**රෝමය**

රෝමය ගත්විට ශාරීරික ව්‍යායාම, සරඹ වැනි ක්‍රීඩා කෙරේ වැඩි අවධානයක් යොමු කර ඇත. ඊට අමතරව කරත්ත රේස්, කඩු සරඹ, සර්කස් ආදිය ද පවත්වා ඇත. පසු කාලීනව සුඛෝපභෝගී ජීවිත වර්ධනය වීමත් සමඟ විවිධ ක්‍රීඩා සඳහා යොමු වී ඇත.

**ක්‍රීටය**

ක්‍රීටය ගත්විට එය කඳුකර රටක් වීම නිසා භෞතික සාධක මඟින් පාලනය වූ ක්‍රීඩාවන් සිදු කර ඇත. ඔවුන් පාගමනින් දඩයම් කිරීම, දුනු ශිල්පය, බර විසි කිරිම, ආදියත් අශ්ව රේස්, නැටුම්, මල්ලව පොර, සතුන් භාවිත විවිධ ක්‍රීඩා කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වා ඇත.

**ඉන්දියාව**

ඉන්දියාවේ පැවති ඉපැරණි ක්‍රීඩාවන් පිළිබඳව අවධානය යොමු කිරිමේදි ඒ පිළිබඳව මහාභාරතය, රාමායනය යන ග්‍රන්ථ තුළ මෙවැනි ක්‍රීඩා පිළිබඳව කරුණු ඉදිරිපත් කර ඇත. දඩයම් ක්‍රීඩා, යුධ කටයුතු සඳහා තරුණයන් යෙදවීම සඳහා පොළඹවන සුළු ක්‍රීඩා පවත්වා ඇත. ඒ වගේම ඉන්දියාවේ බුද්ධකාලීන සමාජය පිළිබඳව අවධානය යොමු කිරීමේදී සිද්ධාර්ථ කුමාරයා යශෝදරා කුමාරිය විවාහ කරගැනීම සඳහාද සරඹ ක්‍රීඩා උළෙලක් පවත්වා ඇත. ඒ අතර ක්‍රිස්තුස් වහන්සේගේ උපතට පෙර කාලයේදි ඉන්දියාවේ අශ්වයන් පිට යෑම, අශ්ව රේස් දියුණු අවස්ථාවක තිබි ඇත. ඊට අමතරව විවිධ යෝගී ශාරීරික ව්‍යායාම්ද බහුල වශයෙන් ඉන්දියාවේ පැවත ඇත.

**ජපානය**

ජපානයේ සුමෝ මල්ලව පොර, ජූඩෝ, කියෝතෝ දුනු ශිල්පය, පිහිනීම යන සටන් වලට නැඹුරුවූ ක්‍රීඩාවන් පැවත ඇත. මේ සඳහා කාලගුණය, ඔවුන්ගේ සංස්කෘතිය බොහො දුරට හේතුවී ඇත.

## ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාව ගත් විට අත් පැරණි ශිෂ්ටාචාරවල පැවති ක්‍රීඩාවලට සමාන ක්‍රීඩාවන් පැවති බවට සාධක හමුවේ. පිණුම් ගැසීම, පැනීම, මල්ලව පොර, අසුන් පිට නැග සටන් කිරීම, දුනු ශිල්පය, ජල ක්‍රීඩා, කොටු කිරීම් සහ වෙනත් ජන ක්‍රීඩාවන්ද පැවතිණි. පසු කාලීනව මේවා අධිරාජ්‍යවාදී පාලනයන් සමග වෙනස් වී ඇති අතරම අපරදිග ක්‍රීඩාවන් හා මිශ්‍රවීමක්ද සිදු වී ඇත.

ඉහත සඳහන් ආකාරයට අතීතයේ සෑම රටක්ම පාහේ කුමන හෝ ක්‍රීඩා ක්‍රියාකාරකමක නිරත වී ඇත. එම ක්‍රීඩාවන්, භෞතික සාධක වලට සීමාවී තිබිණි. එනම් ඒවා ඉක්මවා යාමක් සිදු නොවිණි. කඳුකර ප්‍රදේශ වල (රටවල) මිනිසා විසින් තමන්ට පහසුවෙන් ක්‍රියාත්මක කල හැකි ක්‍රීඩාවන් සඳහා පුරුදු විය. නැතිනම් ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේදී කරනු ලබන ක්‍රියාවක නිපුණත්වය ක්‍රීඩාවක් ආකාරයට භාවිතා කර ඇත. උදාහරණ වශයෙන් දඩයමේ යාම, යුධ උපක්‍රම හා පුහුණුවීම් ආදිය දැක්විය හැකිය.

## අතීත සහ වර්ථමාන ක්‍රීඩාවල වෙනස්කම්

අතීත ක්‍රීඩාවේ තත්ත්වය හා වර්ථමානයේ තත්ත්වය පිළිබඳව අවධානය යොමුකිරීමේදී වැදගත් වන්නේ ඉහත සඳහන් රටවල ක්‍රීඩාවන් භෞතික සාධක, බාධක අභිබවා ගොස් ඇති බවයි. යම් කිසි රටක එම ක්‍රීඩාවන් සඳහා පහසුකම් නොමැති නම් ඒවා කෘතිම වශයෙන් ඇතිකර ඒ ක්‍රීඩාවන් පවත්වා ගෙන යනු ලබයි ඒ අනුව අතීතයේදී යම් කිසි රටකට ක්‍රීඩාවන් සීමා වූ අතර වර්ථමානයේදී දේශ සීමා අභිබවා ගොස් ක්‍රීඩා ව්‍යාප්ත වී ඇත. සෑම රටකම මළල ක්‍රීඩා, කණ්ඩායම් ක්‍රීඩා ආදිය ජාත්‍යන්තර නීතිරීති අනුව පවත්වනු ලබයි. එසේම ප්‍රාදේශීය, ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා උත්සවද සංවිධානය කරයි.

මීට අමතරව අතීතයේ පැවැති ජයග්‍රහණ සැමරීමේ සම්ප්‍රදායික ක්‍රම වෙනුවට වර්ථමානයේදී මුදල් භාණ්ඩ මෙන්ම වෙනත් දීමනාද ලබාදෙයි. එමෙන්ම දිනපතා පුහුණුවීම් මෙන්ම වෘත්තිය මට්ටමේ ක්‍රීඩකයන්ද දැකිය හැකිය ඒ අනුව ක්‍රීඩාව වර්ථමානයේදී සතුට විනෝදය පමණක් නොව ආර්ථිකමය වාසි සලසන එකක් බවටද පත්ව ඇත. බොහෝ රටවල් ක්‍රීඩාව වාණිජ පරමාර්ථයෙන්ද පවත්වනු ලබයි. මීට අමතරව වැදගත් වන්නේ ක්‍රීඩා සංවිධානයන්ය. මේවාද ප්‍රාදේශීය ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් සංවිධානය වී ඇත. මේවා මඟින් විවිධ රටවල් ක්‍රීඩා සඳහා සංවිධානය කිරීමත්, නීතිරීති පැනවීමත් එවා ක්‍රියාත්මක කරවීමත් සිදු කරනු ලබයි. රටවල් අතර ඇති විවිධ අසමගිකම් ඉවතලමින් ඉතාම සාමයෙන් යුක්තව එකට විනෝද වන අවස්ථාවක් වශයෙන්ද ක්‍රීඩාව පවත්වාගෙන යනු ලබයි. එතුළින් ලෝක සාමයක් ගොඩනැගීමේ හැකියාවද වර්ධනය වී ඇත. අතීතයත් සමඟ බලන විට වර්ථමානයේ දී ක්‍රීඩාවන්ගේ අරමුණු ක්‍රියාකාරකම් වල පැහැදිළි වෙනස්කම් දැකිය හැකිය. ඒ අනුව සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික යන සියලු අංශයන්ගේ අවශ්‍යතාවන් පදනම් කරගෙන ක්‍රීඩාවන් පවත්වනු ලබයි.

## නිගමනය

සමස්තයක් ලෙස අතීතයේදී පැවති ක්‍රීඩා වෙනත් අරමුණක් ඉටුකරගැනීමට ගත් උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වී ඇති බවත්, එය රටින් රටට වෙනස් ස්වරූපයක් ගෙන ඇති බවත් පැහැදිළිව පෙන්නුම් කරයි. ප්‍රදේශයක ඇති භෞතික ස්වරූපයට අනුව, අවශ්‍යතාවයට අනුව එය නිර්මාණය වී ඇත. මීට අමතරව අතීතයේදී ක්‍රීඩාවේ පැවති ස්වරූපය, ක්‍රමය, වේගය, අරමුණු, ත්‍යාග පිරිනමන ආකාරයත් වර්ථමානය වන විට සමාජ අරමුණුත් සමඟ නවීකරණය වී ඇත.